| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| **11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - II** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ප්‍රශ්න අංක 2 - 7 දක්වා ප්‍රශ්නවලින් හතරක් ඇතුළුව මුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01)

i. පාසල් සිසුන් වන ඔබගේ අනාගත ජයග්‍රහන අඩපණ කිරීමට හේතුවන මාර බලවේග දෙකක් නම් කරන්න.

ii. ඉහත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට ඔබ තුළ ඇති කරගත යුතු උතුම් ගුණාංග දෙකක් ලියන්න.

iii. මහා කාශ්‍යප ථේර බොජ්ඣංගය, මහා මොග්ගල්ලාන ථේර බොජඣංගය යන සූත්‍ර දේශනා ඇසුරින් බුද රදුන්ගේ කවර උතුම් ගුණාංගයක් ප්‍රකට වේද?

iv. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පූරණය කරනු උතුම් පිළිවෙත් කවර නමකින් හැඳින්වේද?

v. "දූරං ගමං ඒකචරං - අසරීරං ගුහාසයං" යන ධම්මපද ගාථාවේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

vi. මිතුරෙකුගෙන් මිතුරාට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

vii. ධාර්මිකව ධනය ඉපයිය හැකි රැකියා දෙකක් නම් කරන්න.

viii. පුද්ගල දියුණුවට හේතුවන මංගල කරුණු දෙකක් ලියන්න.

ix. කණිෂ්ක සංගායනාවේ ප්‍රධානත්වය හා සභාපතීත්වය ලැබුණු හිමිවරු නම් කරන්න.

x. නිවැරදි ආහාර පරිභෝජනයට අදළ සේඛිය දෙකක් ලියන්න.

(ලකුණු 20)

02)

i. සිඟාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර හා උතුර යන දිශාවන්ට අනුගත සමාජ සංස්ථා දෙක නම් කරන්න. (ල 2)

ii. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ල 3)

iii. පවුලේ සාමය, සතුට, විශ්වාසය රැකෙන පරිදි සාර්ථක පවුල් ජීවිතයක් ගතකිරීමට බුදදහමින් ලැබෙන උපදේශයන් විස්තර කරන්න. (ල 5)

03)

i. වචනයෙන් සිදු කෙරෙන අකුසල් දෙකක් නම් කරන්න. (ල 2)

ii. අකුසල මූල තුන නම් කරන්න. (ල 3)

iii. වර්තමාන කර්ම වලින් සහ පරිසර සාධක ඇසුරින් අතීත කර්ම ශක්තිය පාදු ගැනීමට හා වෙනස් කර ගැනීමට හැකිය. (ගති, උපධි, කාල, ප්‍රයෝග, සම්පත්ති ඇසුරින්) විස්තර කරන්න. (ල 5)

04)

i. "සුකරානි අසාධූනි ....." ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න. (ල 2)

ii. එම ගාථාවේ අදහස ලියන්න. (ල 3)

iii. ධම්ම පදයෙහි ඇති සදුපදේශයන් පුද්ගල ජීවිත සාර්ථකත්වයට යොදා ගත හැකි ආකාරය පහදන්න. (ල 5)

05)

i. බුදු රදුන් තුළ පැවති තාදී ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් දක්වන්න. (ල 2)

ii. පාරමිතා ගුණධර්ම පුහුණු කරන්නෙක් ඒවා කරුණු පහකින් සම්පූර්ණ කරයි. ඉන් තුනක් ලියන්න. (ල 3)

iii. බුදු රදුන් වීර්ය පාරමිතාව පිරූ ආකාරය ඔබ ජීවිතයට ආදර්ශයක් කර ගනිමින් පහදන්න. (ල 5)

06)

i. බෞද්ධ හේතුඵල දහමට අනුව "ඉමන්ස උප්පාද - ඉදං උප්පජ්ජති" යන්නෙහි අදහස ලියන්න. (ල 2)

ii. යමක හට ගැනීම පිළිබඳව බුද්ධ කාලීන භාරතයේ පැවති මතවාද තුනක් ඉදිරිපත් කරන්න. (ල 3)

iii. බෞද්ධ හේතුඵල දහමට අනුව ශිෂ්‍ය ජීවිතයේ ඇතිවන ගැටලුවක් නිරාකරණය කරගන්නා ආකාරය විස්තර කරන්න. (ල 5)

07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. දුටුගැමුණු රජතුමා

ii. පංච නීවරණ ධර්ම

iii. සතර අගතිය

iv. ස්තූපය

(ල 5 x 2=10)